# කස්තිරම

**ඩී බී කුරුප්පු**



# හෙන්රි ගේ සාහිත්‍ය සේවාව

හෙන්රිගේ පොත ගැන ලියූ එකම ලේඛකයා මා පමණකැයි ද සිතමි. ඔහුගේ පොත සන්දේශ කාව්‍යයකි. සිඩ්නි නගරාසන්නයේ පිහිටි කටුම්බා පන්සලෙන් පිටත් වන දූතයා වූ සමනළයා නැගෙනහිර වෙරළාසන්න පෙදෙස උඩින් පියාසර කොට මහා දුරක් ගෙවා ශ්‍රී ලංකාවට සැපත් වන්නේ ය. සන්දේශය බාර දෙන්නේ එවකට ජනාධිපති ධුරය දැරූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගට ය. කවියාගේ ආයාචනය ඉටු කරන්නට නම් සන්දේශලාභියා සමත් වන්නේ නැත. එය ඉටු කරමින් ත්‍රස්තවාදය පරාජය කරන්නේ ඇගෙන් පසුව ඒ තැනට ආ මහින්ද රාජපක්ෂ ජනාධිපති ය.

හෙන්රි ඩෙල්සන් කුමාරප්පෙරුම විසින් "සමනළ දූතය" නමින් ඒ සන්දේශ කාව්‍යය පළ කරන ලද්දේ 1995 දෙසැම්බරයේ දී ය. ඒ බණ්ඩාරනායක පරපුරේ අවසානයට ළං වූ නොහොත් කුමාරතුංග යුගය පටන් ගත් අලුත ය. ඔහු ඉල්ලා සිටි පරිදි -

"රට දැය නසන කොටි උවදු නසන්නට"

ඇය අසමත් වූ පසු, එය ඉටු කළ ජනාධිපති රාජපක්ෂට පිරිනමන්නට හෙන්රි පොතක් ලියුවේ ය. ඒ 2009 දී පළ කරන ලද ඔහුගේ නවකතාව " "ගම්සරණිය" යි.

සමනළ දූතය කුමාරතුංග ජනාධිපතිනියට දෑතින්ම පිරිනැමුවාදැයි නොදනිමි. එහෙත් මාතෘකාව අනුකරණයක් බව පාඨකයාට (සන්නස) එක් වරම හසු වනු ඇත. එය අනුචිත වූවක් යයිද පසුව පෙනී යා හැකිය. ඒ මා මාතෘකාවෙන් පිට පනින්නට හිතන නිසා ය.

පළමුකොට හෙන්රි හඳුන්වා දිය යුතුය. ඕස්ට්‍රේලියානු සිංහල සාහිත්‍යයේ සිටින එකම හෙන්රි ඔහු ය. එපමණක් නොවේ. ඒ සාහිත්‍යයේ පුරෝගාමියා වන්නේ ද මේ හෙන්රිම ය. මගේ මුල් කෙටි කතා පොත (මෙහිදී ලියූ) "ලංකාවක් වගේ පුංචි" පළ කරන්නටත් පළමු මගේ හිතවත් එල් බී ඒකනායක කීවේ එය "මෙරට සිංහල සාහිත්‍යයක් ගොඩ නැංවීමට මෙය මුල් ගල වේවා" කියා ය. ඔහු ඊට කලින් ලියා පළ කරන ලද පොත ගැන නොදැන සිටි බව පෙනෙයි. ඔහු තබා මා දැන ගත්තේත් කලකට පසුව ය.

එහෙත් මට හෙන්රිගේ තැන උදුරා ගන්නට වුවමනාවක් නැත. මෙරටට ආ අපේ උදවියගේ දිවිය ඇසුරෙන් රචිත මුල් කෙටිකතා පොත ලිවීමට ලැබීම ගැන සතුටු වෙන එක මට සෑහෙයි. එය පළ වූයේ 1998 දී ය.

නවකතාව නම් මහින්ද රාජපක්ෂට අතින්ම පිරිනැමූ බවයි, මා සිතන්නේ. හෙන්රි එය පුදන්නේ මෙන්න මේ වාගේ කවියක් ද පොත මුලට යොදමිනි.

සත් සමුදුරු එතෙර සිටියද ඔසී දෙසේ<br>
එමතුද නොවෙයි සිත මවුබිමෙහි නිති වෙසේ<br>
ගරු ජනපති එඩිතර පුතු රුහුණු දෙසේ<br>
අවසර "ගම් සරණිය" පුදනු බැති තොසේ"

මේ පොත් දෙක අතර පංචතන්ත්‍ර පරිවර්තන කාව්‍යයක කොටස් දෙකක් ඔහු විසින් රචනා කරන ලද බව (එකක් මුද්‍රණයෙන් පිට වී ඇත) කියැවුණත් මා දැක නැත.

ඇත්ත වශයෙන් මා ඔහුගේ "සමණළ දූතය" කියවූයේ ද පහන සඟරාවට "පූර්ණක" යන රසික නාමයෙන් ග්‍රන්ථ විවේචනයක් ලිවීමට පටන් ගත්තාට පසුව ය. ඒ 2003 න් පසුව ය - ජගත් ජේ එදිරිසිංහ එහි සංස්කාරකයකුව සිටි අවධියේ ය. පොත් කිහිපයක් ගැන ලියුවාට පසු සමණළ දූතයත් පහනට ලැබුණ බව කිව යුතු ය. ඒ නිසා ඒ පොත ගැන ලියන ලද එකම විවේචනය මා ලියූ අගැයීම වන්නටත් ඉඩ තිබේ. මට මතක තවත් පොතක් ඒ විදියට පහන ට තැපෑලෙන් ලැබුණකි - නිමල් ප්‍රනාන්දු ගේ "සම්මාන සංධාම" නම් වූ පරිවර්තනය.

මා ඒ ලිපි පෙළ ඇරඹුවේ ඒ වන විට අලුතින්ම පාඨකයා වෙත පැමිණි හේමමාලා හේරත් ගේ උත්තරා නම් නවකතාව ගැන ලියූ විවේචනයකිනි. තවත් නවකතාකරුවකු වන සමන් මහානාම දිසානායක ගේ මුල් පොත් දෙක ගැන ලියූ බවත් මට මතක ය. ඒ පොත් දෙකම මා විසින් මිලට ගෙන තිබුණ නිසා ය. ඉන් පසු මට ඔහු ලියූ පොත් කියවන්නට ලැබී නැත. මා කණගාටුවන්නේ ඔහුගේ නවකතා පිළිබඳව සැළකිය යුතු විචාරයක් කිසිවකු විසින් නොකරන ලද බව පෙනෙන නිසා ය.

තවත් නවකතා කාරියක වෙනුවෙන් වරුණ සාවින්ද ට කතා කළ පුද්ගලයෙක් ඒ පොතක් ගැන ලියවා ගන්නට අදහස් කළේ ය. අපේ විවේචනයට පොත එවන්නැයි වරුණ කීවත් එහෙම ආවේ නැත. කතා කළ පුද්ගලයාට අවශ්‍ය වූයේ විවේචකයා අතට පොත නොදී ඒ ගැන විචාරයක් පළ කරවා ගන්නට ය. ඉඳ හිට වතාවක ඒ වාගේ විස්තර පහනේ ද පළ වූ බව මට මතක ය. මා එය අනුමත නොකළ බවත් අවධාරණය කරමි.

මට නවසිය හැටේ දශකය සිහියට නැගෙන්නේ ඒ වෙලාවට ය. ඒ මා දිනමිණ ට නාට්‍යය හා කලාව ගැන සතිපතා ලියමින් සිටි අවදියයි. මා විවේචනය කරන නාට්‍යයක් නොහොත් වෙනත් දෙයක් පිලිබඳ දැඩි පරිපාටියක් අනුගමනය කිරීමට දිනමිණ විශේෂාංග සංස්කාරක පුරුදුව සිටියේ ය. පත්තරයට ලැබුණු ආරාධනා මත පමණකි, මට නාට්‍යයක් නරඹා විවේචනයක් ලියන්නට අවසර තිබුණේ. කෙළින්ම මා අතට පත් ඇරැයුමකට එබන්දක් නරඹා විවේචනයක් ලියුවත්, පළ කිරීම ප්‍රතික්ෂෙප කරන ලදී. විශේෂාංග සංස්කාරක සිසිල් ඉලංගකෝන් මගේ සරසවි සගයෙක් විය. එහෙත් ඔහුගේ මේ ස්ථාවරය කිසි විටෙක වෙනස් කළේ නැත. ග්‍රන්ථ විවේචනය පිළිබඳවද අනුගමනය කරන ලද්දේ ඒ සමාන පටිපාටියකි. පොතක පිටපත් දෙකක් ඉදිරිපත් කළ යුතු විය. එකක් දිනමිණ පුස්තකාලයට ය. (එහෙම එකක් තිබුණාදැයි නොදනිමි) දෙවැන්න විවේචකයාට ය. විවේචකයා තෝරා ගන්නේ විශේෂාංග සංස්කාරක ය. පොත් කතුවරයාට කැමැති කෙනෙකුට එය දෙන්නට බැරි ය. ඔහුගේ කීමට කෙනෙකුට ඒ කාරිය බාර දෙන්නේ ද නැත. මට මතක් වන්නේ ඩී එෆ් කාරියකරවන කියාපු කතාවක් ය. එය ඔහු කිහිප වතාවක් ම සඳහන් කර තිබුණ කරුණකි. කේ ජයතිලක විසින් තමාගේ පොතක් ගැන කෙනකුට කියා ලියවා ගත් විවේචනය අතට දුන්විට එය පළ කරන්නට බැරි යයි කාරියකරවන ජයතිලකට කියා ඇත. කාරියකරවන එම

***මේ රටේ අලුතින් බිහිවන ඔස්ටේලියානු සිංහල සාහිත්‍යය සැබෑ වර්ධනයක් උදෙසා අප විසින් පිළිගත හැකි විදියේ විචාරක සම්ප්‍රදායක් ගොඩ නංවා ගත යුතු බව මම කල්පනා කරමි.***

ප්‍රතික්ෂෙපය ආඩම්බරයෙන් සිහිපත් කරන සැටියක් ද මම දුටුවෙමි.

කාරියකරවන හා සිසිල් ඉලංගකෝන් දෙන්නාම අනුගමනය කළ පිළිවෙත සාහිත්‍ය කලා විවේචනයට හිතකර වූත් සවිමත් වූත් පදනමක් සපයන්නට සමත් වූ බව කිව හැකි ය. කනගාටුවට කරුණ වනුයේ ඒ පදනම මත ගොඩ නැංවුණ විවේචන කලාවක් නොහොත් සම්ප්‍රදායක් අද ශ්‍රී ලංකාවේ දකින්නට නොලැබීම ය. අපක්ෂපාත ග්‍රන්ථ විචාරයක් දක්නට ලැබෙන්නේ කලාතුරකිනි. වැඩිකොටම හිතවතුන් විසින් ලියනු ලබන වර්ණනා ය. ඉඳහිට විරුද්ධවාදියකුගේ නිර්දය ප්‍රහාරයක් ද කියවිය හැකි ය. මේ තත්වය නොවෙනස්ව පැවතීම ගැන වගකීම පැවරිය යුත්තේ කවරකුට ද යන්න සිතීමට පවා දුෂ්කර ය.

මේ රටේ අලුතින් බිහිවන ඔස්ටේලියානු සිංහල සාහිත්‍යය සැබෑ වර්ධනයක් උදෙසා අප විසින් පිළිගත හැකි විදියේ විචාරක සම්ප්‍රදායක් ගොඩ නංවා ගත යුතු බව මම කල්පනා කරමි. එහෙත් මව් බිමේ ආදර්ශයෙන් මිදී සිටීම උගහට ය.

මා පාලිත ගනේවත්ත ලියන විචාර ලිපි පෙළ අගය කරන්නේ යටත් පිරිසෙයින් එක් පුද්ගලයකු හෝ ඒ අතින් දරන ප්‍රයත්නයක් වශයෙනි. මගේ සාහිත්‍ය සේවාව ගැන ඔහු ලියන ලිපි අගය කිරීමට එක් ආත්මාර්ථකාමී සාධකයක්ද ඇති බව අවංකව කිව යුතු ය. කිසිකෙනකු කිසිදාක විචාරයට භාජනය නොකළ මගේ පොත් සමහරක් ගැන පමා වී හෝ ලියන සැටියක් දැකීම මට සතුටකි. එය ආත්මාර්ථකාමී සාධකයයි. ඒ හැරුණ විට මා විටෙක මහ ඉහළින් ගණන් ගත් සමහර තැන් - විස්තර නොහොත් කතන්දර වල ඇති දුබලතා එඩිතරව පෙන්වා දීමට පාලිත සමත්වීම මම අගකරන්නෙමි. ඒ බව ඔහුට පුද්ගලිකවම කියලාත් ඇත.

දැන් ආපහු මාතෘකාවට සිත් යොමු කළ හැකි ය. එය යොදා ගන්නට මට හිතක් ආවේ මේ රටේ සිංහල පොතක් ලියන්නට ඉදිරිපත් වූ පළමුවැන්නා කාලයක්ම නිහඬවන්නේ නැතිව දිගින් දිගටම ඒ කාරියට අත ගැහුවා නම් ආචාර්ය පාලිත ගනේවත්ත සාහිත්‍ය පැතිකඩට ලියනු ඇත්තේ ඩී බී ගේ නොව හෙන්රි ගේ සාහිත්‍ය සේවාව ගැන නොවේදැයි කියන කල්පනාව අනුව ය.

හෙන්රි කුමාරප්පෙරුම මෙල්බර්න් පුරවරයට පම්ප්‍රාප්ත වූ විටෙක මට "ගම් සරණිය" පිටපතක් දෙමින් නොකියා කිව්වේ පොත ගැන ලියන්නට ය. බල කළේ නැත. මා ඒ ගැන පහනේ පළ කළ කෙටි සටහනක් දැක තිබුණත් විවේචනයක් නොකියවූ හෙයින් මම ඔහුගෙන් කෙළින්ම ප්‍රශ්නයක් ඇසීමි. ඒ සන්නසට හෝ පහනට පිටපතක් දුන්නා ද කියාලා ය. දීලා නැත. එහෙනම් විවේචනයක් බලාපොරොත්තු වන්නේ කෙසේ ද?

මම වතාවක් තරමක් දරුණු කතාවක් කීවෙමි. ඒ මගේ පොත් දෙකක්ම පහන - සන්නස - දෙකෙහිම සංස්කාරකයන්ට දුන් පසුවත් ඒ ගැන වචනයක් වත් නොලිවීම ගැන චෝදනා කරන අතර ය මා කීවේ සිංහල භාෂාව හා සාහිත්‍යය මේ රටේ වර්ධනයට රුකුල් දිය යුතු මේ ප්‍රකාශන දෙකම මේ රටේ පළවන පොතක් ඉදිරිපත් කළත් - නොකළත් - ඒ සොයාගෙන හෝ ඒ පිළිබඳ අගැයීමක් කළ යුතු බව ය. පොතක් පළ කරවා ගත්තකුට නොමිලේ පොතක් ලබා ගන්නට බලා සිටින සැළකිය යුතු පිරිසකට පිටපත් දීමට හැකි නම් පොත ගැන අදහසක් ප්‍රකාශ කළ හැකි - කළ යුතු - පුවත්පතකට සඟරාවකට දීම ප්‍රශ්නයක් නොවිය යුතු ය. ඒ ටික කරන්නට කතුවරයා පසුබට වෙතොත් විවේචනයක් පැතීමට ඔහුට අයිතියක් ඇතැයි සිතිය නොහැකි ය

දැන් හෙන්රිගේ නව නිර්මාණය ගැන යමක් ලිවීම අවශ්‍යමය. මාතරට නුදුරු ගමකපොල් ලෙලි තැලීමෙන් ජීවිකාව කර ගන්නා පුද්ගලයන් හා ඔවුන්ගේ නිෂ්පාදන අලෙවියෙන් මුදල් උපයන පුද්ගලයන් දෙතුන්දෙනකුද මුල් කරගෙන රචිත ගම් සරණියෙන් ගැමි දිවියේ ලක්ෂණත් ගැමියන් කිහිප දෙනකුගේ චරිතත් සිත් ගන්නා අයුරින් ඉදිරිපත් වන්නේ ය. විශේෂයෙන් සොලොමන් මුදලාලි - ඔහුගේ බිරිය අංගොහාමි පිනෝනා යන චරිත සඳහන් කළ යුතු ය.

කතා නායකයා වශයෙන් ගත යුත්තේ සොලොමන් මුදලාලි පුත් දයාන් ය. ගමේ පාසලේ දක්ෂ ශිෂ්‍යයකු වූ ඔහු පසුව කොළඹ සරසවියට ඇතුළු වී උපාධිලාභයෙන් අනතුරුව රජයේ රජයේ නිලධාරියකු ලෙසින් ගම් පෙදෙසටම අවුත් එහි සංවර්ධනයට ක්‍රියා කරයි.

මුලින් සඳහන් කළ චරිත වාගේ කතා නායකයාගේ චරිතය විශ්වසනීය ආකාරයට වර්ධනය වන්නට දෙමින් කතාව දිගට ගෙන යාමට කතුවරයා සමත් නොවන්නේ දයාන්ගේ චරිකයට පමණට වඩා යහගුණ ආරෝපනය කිරීමට යාම නිසාදැයි නොදනිමි. මට පෙනෙනා ආකාරයට කොළඹට පැමිණි පසු දයාන් ගේ චරිතය සාර්ථක අයුරින් වර්ධනය කරන්නට හෝ නිරූපනය කරන්නට ඔහු සමත් නොවේ. ගමේ තොරතුරු ඇතුළත් කොටසේ ඇති නිරායාසයෙන් ගලා යාමක් රහිත මේ කොටස එක්තරා කෘතිම ස්වභාවයක් දරන හැටියකි, මා දකින්නේ.

දයාන් සරසවියට බැඳෙන අවදියේ කොළඹ නගර සභාවේ පවිත්‍රතා කම්කරුවන් විශේෂ නිල ඇඳුමකින් සැරසී සිටි බව ගම සරණියෙහි කියතත් මට මතක හැටියට ඒ ඇඳුම් හඳුන්වා දෙන ලද්දේ ප්‍රේමදාස අගමැති යුගයේ දී ය. පැයක් ඇතුළත දයාන් ඔහුගේ පෙම්වතිය සරසවියේ සිට විහාර මහා දේවී උද්‍යානයට ගොස් එහිදී පෙම් රැඟුම් පාමින් සිට ඊළඟ දේශනයට කල් තියා යන්නට සමත් වීමද අදහා ගත නොහැක්කකි.

මා දක්වන අදහස් ද විවේචනයට හා සාකච්ඡාවට භාජන විය යුතුයයි සිතමි. මගේ වචන සර්වතෝභද්‍ර විය යුතු යයි මම කිසි විටෙක නොකියමි - නොඅදහමි.

තවත් සඳහන් කළ යුතු කරුණක් ඇත. කලින් වතාවක මගේ ලිපියක මම සිනුවර යන නම සිංහලට හඳුන්වා දීමේ ගෞරවය රසික සූරියාරච්චිට පිරිනැමීමි. මගේ නිගමනය වැරදි බව මට පෙන්වා දුන්නේ රසික මය. ඒ වචනයේ නිර්මාතෘ තමා නොව හෙන්රි කුමාරප්පෙරුම බව ඔහු අවධාරණය කළේ ය. මගේ වරද පිළිගනිමින් ඒ ගෞරවය හෙන්රිට පිරිනමන්නට මෙය අවස්ථාවක් කර ගනිමි. ■

ADVERTISING
සන්නස
Please call
Asoka
on
0425 720 932